# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2203/22 - 2020 නොවැම්බර් මස 25 වැනි බදාදා - 2020.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/04/2016/129.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපණත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

**4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.09.28 වන දින අංක 2038/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ* ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2017.09.21 වැනි දින දරන නියෝගයෙන්,

කේ. ඩබ්. රංජන් සිසිර මයා,
අංක 1144/5/ඒ,
ලියනගොඩ පාර,
කොට්ටාව,
පන්නිපිටිය.

සහ

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම,
අංක 411,
ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල,
ගාලු පාර,
කොළඹ 03.

අතර පවත්නා 2017.06.22 දින දරන කම්කරු කොමසාරිස්ජනරාල්වරයා (වැඩබලන) ගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ටී. පියසෝම මයා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2017.09.21 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

12-51/1


1A - G 33275 – 40 (2020/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය : IR/COM/04/2016/129.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

කේ. ඩබ්. රංජන් සිසිර මයා,
අංක 1144/5/ඒ,
ලියනගොඩ පාර,
කොට්ටාව,
පන්නිපිටිය.

සහ

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම,
අංක 411,
ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල,
ගාලු පාර,
කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

පිළියන්දල,
නාම්පමුණුව,
කුමුදු මාවත,
අංක 89/F,

සුනෙත් ලොකුබෝගහවත්ත මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය : IR/COM/04/2016/129.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. ඩබ්. රංජන් සිසිර මයා,
අංක 1144/5/ඒ,
ලියනගොඩ පාර,
කොට්ටාව,
පන්නිපිටිය.

සහ

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම,
අංක 411,
ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල,
ගාලු පාර,
කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,
"සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ විශේෂ (M2) ශ්‍රේණියේ ගබඩා නිලධාරියකු ලෙස සේවය කළ කේ. ඩබ්. රංජන් සිසිර මහතාට විරුද්ධව විනය පරීක්ෂණයක් පවත්වා ඔහුව A5 ශ්‍රේණියේ ගබඩා සහකාර තනතුරට තත්ත්වයෙන් පහත හෙළීම හා අදාළ විනය නියෝගයෙන් ඔහුට ලබා දුන් අනෙකුත් දඬුවම් යුක්ති සහගත ද? එසේ නැත්නම් එම සේවකයාට හිමිවිය යුතු වෙනත් සහනයක් ඇත් ද?".

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

12-51/2

මගේ අංකය : IR/COM/03/2016/143.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපණත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.08.02 වන දින අංක 2082/53 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ* ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.07.24 වැනි දින දරන නියෝගයෙන්,

සීතා විජේසූරිය මිය,
"ශාන්ති"
තලාවිටිය,
පරකඩුව

සහ

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය,
අංක 25, ගෝල්ෆේස් ටෙරස්,
කොළඹ 03.

අතර පවත්නා 2018.07.16 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. කාරියවසම් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2018.07.24 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

12-52/1

---

මගේ අංකය : IR/COM/03/2016/143.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපණත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

සීතා විජේසූරිය මිය,
"ශාන්ති"
තලාවිටිය,
පරකඩුව

සහ

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය,
අංක 25, ගෝල්ෆේස් ටෙරස්,
කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

කොළඹ 06,
පොල්හේන්ගොඩ,
එඩ්මන්ටන් නිවාස,
XB-10-1-2,

ඩී. ජී. කේ. කරුණාරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය : IR/COM/03/2016/143.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

සීතා විජේසූරිය මිය,
"ශාන්ති"
තලාවිට්ය,
පරකඩුව

සහ

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය,
අංක 25, ගෝල්ෆේස් ටෙරස්,
කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ

"රාජ්‍ය මැණික් සංස්ථාවේ සේවය කළ සීතා විජේසූරිය මිය 1994 වර්ෂයේ එම සංස්ථාව, අධිකාරියක් බවට පත් කිරීමේ දී අතිරික්ත සේවිකාවක් වශයෙන් සලකා නියමිත වයස එළඹෙන්නට ප්‍රථම පොදු වන්දි ක්‍රමය යටතේ සිය කැමැත්තෙන් සේවයෙන් ඉවත් වීමට කැමැත්ත ප්‍රකාශ කිරීම මත ගෙවිය යුතු වන්දි ප්‍රමාණය ගණනය කිරීමට බුළුමුල්ල වන්දි ක්‍රමය උපයෝගී කර ගැනීමෙන් යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන මොනවා ද යන්න පිළිබඳව වේ".

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 26 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.
12-52/2

---

මගේ අංකය : IR/COM/02/2017/17.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ජේ. ආර්. සමරකෝන් මිය,
V. W. කුලරත්න ඇසෝසියේට්ස් බාරේ,
18/39A,
මුහන්දිරම්,
ඊ. ඩී. දාබරේ මාවත,
කොළඹ 05

සහ

ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ්,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල,
කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

මත්තෙගොඩ,
මද්‍රා උයන,
අංක 149/102,
කේ. කේ. කුමාරි ධනපාල මිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය : IR/COM/02/2017/17.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජේ. ආර්. සමරකෝන් මිය,
V. W. කුලරත්න ඇසෝසියේට්ස් බාරේ,
18/39A,
මුහන්දිරම්, ඊ. ඩී. දාබරේ මාවත,
කොළඹ 05.

සහ

ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ්,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල,
කටුනායක.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ් හි සේවය කර 2013.09.17 දින විශ්‍රාම ගිය ජේ. ආර්. සමරකෝන් නැමැති සේවිකාවට 2013.04.01 දිනට අදාළ වැටුප් වර්ධකය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී තිබේ ද? එසේ අසාධාරණයක් සිදුවී තිබේනම් ඇයට ලැබිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ."

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

12-56

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.